# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,927 — 1970 ඔක්තෝබර් 9 වැනි සිකුරාදා — 1970.10.9**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 737 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 735 | මිළ පාලන දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 736 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 744 |
| | | ''සුරාබද්ද ආඥාපනත'' පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 331**

අංකය : ඩී. 320/ආර්ඊසිවී.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා වෛද්‍ය හේතූන් නිසා යුද්ධ හමුදා සේවය සඳහා සුදුසු නොවන බැවින්, 1970 ඔක්තෝබර් මස 15 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

මේජර් ඉයුස්ටස් ඩේවිඩ් පොන්සේකා, ල.කා.හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 2 දින,
කොළඹ දී ය.

10-364

**1970 අංක 332**

අංකය : ඩී/වීඑෆ්/17 (VI).

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්විතියනය කිරීමක්

යුද්ධ හමුදාවේ ස්වේච්ඡා සේනාවේ පහත නම සඳහන් නිලධාරියාව 1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට මාස නවයක කාලසීමාවකට නිත්‍ය බල සේනාවේ සේවය සඳහා ද්විතියනය කිරීමට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ප්‍රසාදය පළකොට ඇත.

කපිතාන් අශෝක මුදන්නායක, ල.ශි.බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 21 දින,
කොළඹ දීය.

10-251

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

1970 අංක 333

අංකය : ඩී/වීඑප්/2/ඒ (III)

## යුද්ධ හමුදුව—ලංකා සෙවච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

කපිතාන් (උපකරණ පාලක) එඩ්වර්ඩ් දෙන් ජයසිංහ, ල. පා. හ., 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට යුද්ධ හමුදාවේ සෙවච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගෙන ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 21 දින,
කොළඹදීය.

10-254

---

1970 අංක 334

අංකය : ඩී/වීඑප්/38 (III)

## යුද්ධ හමුදුව—ලංකා සෙවච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක් සහ ඇතුලත් කිරීමක්

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පහත නම සඳහන් මහතාව, යුද්ධ හමුදාවේ සෙවච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් කෙනෙකු වශයෙන් අධිකාරියට පත් කිරීම සහ ඔහුව 2 වන (සෙවච්ඡා) බල ඇණිය, ලංකා පාබල හමුදාව, ඒකකයට ඇතුලත් කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කරණ ලදී:—

ගාමිණී ඩයස් ගුණවර්ධන මහතා

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 24 දින,
කොළඹදීය.

.10-253

---

1970 අංක 335

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත.

අංකය : ජේඑම්/ජී. 47/66.

එල්. සමරතුංග මහතා 1970 සැප්තැම්බර් මස 20 වැනි දින සිට 22 වෙනි දින දක්වා ඔහුගේ වෙනත් රාජකාරි වලට අතිරේක වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ධුරය ස්ථිර වශයෙන් උසුලන අය නිවාඩු පිට සිටින අතර එහි වැඩ බැලීමට.

අංකය : සීජේපී/එස්. 16/55

ඩී. ඩබ්ලිව්. එම්. සිරිමාන මහතා 1970 සැප්තැම්බර් මස 23 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් මහනුවර දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සීජේපී/යූ. 1/51

සී. වී. උදලාගම මහතා 1970 සැප්තැම්බර් මස 23 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් කොළඹ දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/ඩී. 16/53

ටී. එෆ්. ද සිල්වා මහතා 1970 සැප්තැම්බර් මස 23 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් මහනුවර දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 6/48

එල්. එච්. ද අල්විස් මහතා 1970 සැප්තැම්බර් මස 19 දින සිට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් බලපිටිය දිස්ත්‍රික් උසාවියේ අංක එන්. ජී. 1761 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 29/49

සී. වී. උදලාගම මහතා 1970 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් මහනුවර දි. උ. අංක එල්. 6974 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 2/66

ආර්. ඉලෙපෙරුම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ආර්. කුලතුංග මහතා 1970 සැප්තැම්බර් මස 17 දින සිට 23 දින දක්වා මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 7/67

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එම්. අබුතාහිර් මහතා 1970 සැප්තැම්බර් මස 21 දින සිට 23 දින දක්වා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 සැප්තැම්බර් මස 21 වැනි දින සිට 23 දින දක්වා සහ 26 හා 27 වැනි දිනයන්හි ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 1/51.

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ටී. කදිර්ගාමලිංගම් මහතා 1970 සැප්තැම්බර් මස 30 වැනි දින යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 ඔක්තෝබර් මස 3 දින ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 සැප්තැම්බර් මස 13 දින සිට 16 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 24/59.

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. තියාගරාජා මහතා 1970 සැප්තැම්බර් මස 25 වැනි දින සිට ඔක්තෝබර් මස 1 දින දක්වා මාතලේ ක්‍රියාකරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්

අංකය : ජේ.එල්/එස්. 26/61.

ජේ. සෝනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1970 සැප්තැම්බර් මස 23 දින සිට 25 දින දක්වා සහ 27 දින ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 14/67.

ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. ආර්. බී. ඒ. ගුණතිලක මහතා 1970 සැප්තැම්බර් මස 27 දින කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 33/67.

ඒ. සයිමන් සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එච්. කරීම් මහතා 1970 සැප්තැම්බර් මස 17 දින නාරාහේන්පිට ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 17/68.

ඒ. එම්. අයි. සහිඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සෝනාධිරාජා මහතා 1970 සැප්තැම්බර් මස 25 වැනි දින සිට වව්නියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

අංකය : සීආර්පී. 13/69.

කේ. ජේ. ජස්ටින් පෙරේරා මහතා 1970 සැප්තැම්බර් මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳවියලුව ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : සීආර්පී. ජී. 11/63.

පී. එච්. ජී. එෆ්. එන්. ද සිල්වා මහතා 1970 ජූලි මස 23 වන දින පිට නැවත නියෝගයක් කරන තෙක් බලපිටිය දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරලේ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : ජේආර්.එම්. 4/52

අයි. එම්. ලියනගේ මහතා 1970 සැප්තැම්බර් මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් දකුණු පළාතේ සියළුම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : සීජේආර්/ඒ. 2/70

ජී. එච්. ජී. එල්. ඒ. ද සිල්වා මහතා 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට තවදුරට නියෝග කරන තෙක් තුන් අවුරුදු ආධුනිකතා කාලයකට යටත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති සහ යටිකිඳ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : සීජේආර්ඒ. 2/70

එම්. එස්. කදුරුගමුව මෙනවිය 1970 සැප්තැම්බර් මස 1 වැනි දින සිට තවදුරට නියෝග කරන තෙක් තුන් අවුරුදු ආධුනිකතා කාලයකට යටත්ව ඌව පළාතේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/එල්. 1/69

අයි. එම්. ලියනගේ මහතා නැති අතර හෝ නැවත නියෝගයක් කරන තුරු එච්. බී. රත්නායක මහතා 1970 අගෝස්තු මස 27 වැනි දින බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති සහ යටිකිඳ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩබැලීමට.

අංකය : පීඑල්/කේ. 7/46

අයි. කිරුපාකරන් මහතා නැති අතර හෝ නැවත නියෝගයක් කරන තුරු සී. රාසයියා මහතා 1970 සැප්තැම්බර් මස 23, 24, 25, 27 සහ 28 වැනි දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ දිවයින් වල සහ බටහිර වලිකාමම්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/57

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියෝගයක් කරන තුරු ඒ. ඩබ්ලිව්. ඒ ඉමෑනුවෙල් මහතා 1970 සැප්තැම්බර් මස 30 වැනි දින සහ ඔක්තෝබර් මස 1 වැනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, නිකවැරටිය, ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ ගිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/70

පී. එස්. රාමචන්ද්‍ර මහත්මිය නැති අතර හෝ නැවත නියෝගයක් කරන තුරු එච්. එම්. ගුණසේකර මහතා 1970 අගෝස්තු මස 19 වැනි දින තංගල්ල දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව නැගෙනහිර ගිරුවාපත්තුව, උතුරුගිරුවාපත්තුව සහ දකුණු ගිරුවාපත්තුව ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එජ්. 1/58

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කර තුරු ඉන්ද්‍රාණි එම්. එස්. ගොඩකුඹුර මෙනවිය 1970 සැප්තැම්බර් මස 18 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ සහ කුකුල්කෝරලේ ගම්බද උසාවි සභාපති සහ නවදුන් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේකයු/ඒ. 41/70

ඒ. එම්. ෂාෆි මහතා 1970 ඔක්තෝබර් මස 5 වැනි දින සිට තුන් අවුරුදු කාල සීමාවකට හෝ නැවත නියමයක් කරන තුරු අවිස්සාවේල්ල අධිකරණ කොට්ඨාශයේ කාතිවරයෙකු වශයෙන්.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ඔක්තෝබර් මස 2 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී.

10-348

---

# ආණ්ඩුවේ නිවේදන

ආඥා අංකය : 10

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57. වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පීර් 13/70-එච්සී/එල්ඒ/8.
වර්ෂ 1970.9.1[illegible] වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අම්බලන්ගොඩ ග්‍රාමයේ බෝ ගහ වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 1, පර්චස් 30 පමණ වූ ඉඩම් කොටස් 3 ට මායිම් :—

(1) උතුරට : අඩි පාර ;
නැගෙනහිරට : අම්බලන්ගොඩ-ඇල්පිටිය ප්‍රසිද්ධ පාර ;
දකුණට : කරත්ත පාර ;
බටහිරට : දියපාර.
හිමිකම් කියන අය : කෝ. චාර්ල්ස් ද සොයිසා මයා., බෝගහ වත්ත, අම්බලන්ගොඩ.

(2) උතුරට : කරත්ත පාර ;
නැගෙනහිරට : අම්බලන්ගොඩ-ඇල්පිටිය ප්‍රසිද්ධ පාර ;
දකුණට : ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : දිය පාර.
හිමිකම් කියන අය : ආර්. එස්. ද සිල්වා මයා., සීමාසහිත අර්මන් ද සිල්වා සහ සමාගම, කොළඹ 10.

ජාතික පුස්තකාල [illegible]

(3) උතුරට : ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : රජයේ ඉඩම (දුම්රිය පාර) ;
දකුණට : අඩිපාර ;
බටහිරට : අම්බලන්ගොඩ-ඇල්පිටිය ප්‍රසිද්ධ පාර.
හිමිකම් කියන අය : ආර්. ඊ. ද සිල්වා, කන්දෙගොඩ, අම්බලන්ගොඩ.

10-341/1

---

ආඥා අංකය : 9

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70-එච්ඩී/එල්ඒ/8.
වර්ෂ 1970.9.18 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ මධ්‍යම පලාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බොගවන්තලාව ග්‍රාමයේ චැපල්ටන් වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 1, පර්චස් 0 ක් පමණ වූ ඉඩම් කොටස් 1 ට මායිම් :—

උතුරට : නෝර්වුඩ්-කොටියාගල ප්‍රසිද්ධ පාර ;
නැගෙනහිරට : දිය පාර ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : රෝ. ක. දේවස්ථාන භූමිය.
හිමිකම් කියන අය : සීමාසහිත ලංකාවේ ස්ටැන්ඩර්ඩ් තේ සමාගම, කොටියාගල, බොගවන්තලාව.

10-341/2

---

ආඥා අංකය : 8

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70-එච්ඩී/එල්ඒ/8.
වර්ෂ 1970.9.18 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුලවූ අලුත්කඩේ (බටහිර) කොට්ඨාශයේ හල්ස්ඩෝර්ප් වීදියේ වරිපනම් අංක 222 දරණ ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.5 පමණ වූ ඉඩම් කොටස් 1 ට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : හල්ස්ඩෝර්ප් වීදිය ;
දකුණට : වරිපනම් අංක 234 දරණ ඉඩම ;
බටහිරට : ඉඩමේ ඉතිරි කොටස.
හිමිකම් කියන අය : ගරු. ජේ. ඒ. ආර්. නවරත්නම් දේවගැති තුමා, සියලු සාන්තුවරයින්ගේ දෙව්මැදුර, 222, හල්ව්ස් ඩෝර්ප් වීදිය, කොළඹ 12.

10-341/3

---

ආඥා අංකය : 7

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාර්මාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාර්මාර්ග, විදුලිබල හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70-එච්ඩී/එල්ඒ/8.
වර්ෂ 1970.9.18 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සීමාව තුලවූ තිඹිරිගස්යාය කොට්ඨාශයේ ජාවත්ත පාරේ වරිපනම් අංක 116 හා 118 දරණ ඉඩම්වලින් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.5 පමණ වූ ඉඩම් කොටස් 1 ට මායිම්.

උතුරට : ව. ප. අංක 118 දරණ ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : ජාවත්ත පාර ;
දකුණට : ව. ප. අංක 116 දරණ ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : ව. ප. අංක 116 හා 118 දරණ ඉඩම්වල ඉතිරි කොටස්.
හිමිකම් කියන අය : ගරු සී. එම්. පීරිස්, මීසම භාර දේවගැති තුමා, යහපත් එඬේරුගේ දෙව්මැදුර, තිඹිරිගස්යාය, හා කො/තිඹිරිගස්යාය විද්‍යාලය, කොළඹ (අධ්‍යාපන දෙපාර්තමේන්තුව).

10-341/4

---

ආඥා අංකය : 6

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70-එච්ඩී/එල්ඒ/8.
වර්ෂ 1970.9.18 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සීමාව තුලවූ පාමන්කඩ (බටහිර) කොට්ඨාශයේ හැම්ඩන් ලේන්හි වරිපනම් අංක 97 දරණ ස්ථානයේ පිහිටි ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.5 පමණ වූ ඉඩම් කොටසට මායිම් :—

උතුරට : එම ඉඩමේ කොටසක්වූ පාර ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : හැම්ඩන් ලේන් නමැති පාර.
හිමිකම් කියන අය : ආතර් ප්‍රනාන්දු සහ අනික් අය.

10-341/5

---

ඇල්.ඩී.—බී. 83/37

## වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත

1969 අංක 44 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ 2 වැනි උප වගන්තිය යටතේ නාවික කටයුතු සහ සංචාරක කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

පී. බී. ජී. කලුගල්ල,
නාවික කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 19 වන දින,
කොළඹ දීය.

### ආඥාව

1964 අංක 44 දරණ පනතින් හා 1970 අංක 1 දරණ පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ කාර්යයන් සඳහා මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම් ප්‍රමාණය අභය භූමියක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## උපලේඛනය

**සේරුවිල-අල්ලායි අභය භූමිය**

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩියාර් පත්තුවේ පිහිටියාවූ ද, ප්‍රමාණය ආසන්න වශයෙන් වර්ග සැතපුම් 60 ක් වූද, පහත සඳහන් පරිදි මායිම් වූද මුළු බිම් ප්‍රදේශය :—

**උතුරට :** කදිරවේලු මුත්තූර් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාරේ පාලාතොප්පූ හංදියේ සිට පාලතොප්පු-තොප්පූර් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ඔස්සේ තොප්පූර හංදිය හමුවන තෙක් ඊශාන දෙසටද, එතැන් සිට සේරුවිල දක්වා යන ගම්සභා පාර ඔස්සේ උප්පූරාල් දක්වා යන පාර හමුවන තුරු නැගෙනහිර දෙසටද, එතැන් සිට එකී පාර ඔස්සේ මුහුදු බඩ දක්වා නැගෙනහිර දෙසටද, ඊසාන දෙසටද, ගිණිකොන දෙසටද, නැවතත් නැගෙනහිර දෙසට ද, අඳින ලද රේඛාවකින් ;

**නැගෙනහිරට :** අන්තිමට සඳහන් කරන ලද ලක්ෂයේ සිට මුහුදබඩ ඔස්සේ වෙරුගල ආරු හමුවන තෙක් දකුණු දෙසට අඳින ලද රේඛාවකින් ;

**දකුණට :** අන්තිමට සඳහන් කරන ලද ලක්ෂයේ සිට වෙරුගල් ආරු ඔස්සේ කදිරවේලූ-මුත්තූර් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර වෙරුගල් තොටුපල දී හමුවන තෙක් සාමාන්‍යයෙන් බටහිර දෙසට අඳින ලද රේඛාවකින් ;

**බටහිරට :** අන්තිමට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කදිරවේලූ-මුත්තූර් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ඔස්සේ ප්‍රදේශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට සහ වයඹ දෙසට අඳින ලද රේඛාවකින්.

10-263

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ඇඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයා ගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, ගාලු දිස්ත්‍රික්කයේ කොට්ටාව ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගි දායක සභාවේ සියළුම සාමාජිකයින් තිලයෙන් ඉවත් කරමි.

අධිකරණ ඇමතිවරයාගේ,<br>පාර්ලිමේන්තු ලේකම්.

1970 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

10-349/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ඇඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයා ගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම ගාලු දිස්ත්‍රිකය තුළ පිහිටි රත්ගම ගම් ප්‍රදේශයේ සමගිදායකයින් ගේ සභාවේ සභාපති ව සිට ඉල්ලා අස් වූ, දොඩන්දූව, රත්ගම, ගම්මැද්දේගොඩ පදිංචි වයිනිස් ලියනගේ මහතා වෙනුවට, බූස්ස, කැදල, "පද්මවිලා" හි පදිංචි කිරිමාදුර පව්ලිස් ද සිල්වා මහතා එකී සභාවේ සාමාජික ධූරය දරණ කාලය තුළ දී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

අධිකරණ ඇමතිවරයාගේ,<br>පාර්ලිමේන්තු ලේකම්.

1970 සැප්තැම්බර් මස 25 වැනි දින,<br>කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

10-349/2

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**මහනුවර ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය මහනුවර ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,<br>සථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,<br>කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

### නාම ලේඛණය

1. එම්. පී. කරෝලිස් මහතා, ස. වි.
2. ටී. එම්. එප්. ජේමක් මහතා, ස. වි.
3. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි), මධ්‍යම කොට්ඨාශය

10-278

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**ගාල්ල ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය ගාල්ල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,<br>සථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,<br>කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

### නාම ලේඛණය

1. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි), දකුණු කොට්ඨාශය
2. විල්ෆ්‍රඩ් සූරියාරච්චි මහතා, ස. වි.
3. එම්. එස්. එම්. බිෂුර්දීන් මහතා.

10-277

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**රත්නපුර ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය රත්නපුර ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,<br>සථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,<br>කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

### නාම ලේඛණය

1. පී. ඒ. සමරසිංහ මහතා
2. දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි), රත්නපුර
3. නිශාල් වෙත්තසිංහ මයා.
4. කරුණාරත්න බෝධිනාගොඩ මහතා
5. දොස්තර පී. අර්සරත්නම් මහතා.

10-276

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**කුරුණෑගල ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය කුරුණෑගල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,<br>සථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,<br>කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

### නාම ලේඛණය

1. ඩබ්ලිව්. ඇම්. නන්දිසේන මහතා (සභාපති)
2. එම්. කේ. එම්. කේ. පාෂා මහතා
3. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) මහනුවර.

10-274

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**උතුරු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය උතුරු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
සචිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛණය

1. කේ. ඩී. ජේ. සිරිවර්ධන මහතා
2. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි), බටහිර කොට්ඨාශය.

10-273

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**මඩකලපුව ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය මඩකලපුව ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
සචිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛණය

1. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) නැගෙනහිර කොට්ඨාශය.
2. පී. සෙල්ලදොරේ මහතා
3. එම්. ඒ. සී. ඒ. රහුමාන් මහතා.

10-272

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**අනුරාධපුර ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය අනුරාධපුර ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛනය

1. වෛද්‍යාචාර්ය එච්. ඒ. සිරෙක්ස් මහතා (සභාපති)
2. වෛද්‍යාචාර්ය කේ. එච්. දිසානායක මහතා
3. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි), උතුරු මැද කොට්ඨාශය
4. තවරත්න බී. ඒකනායක මහතා, ස. වි.,
5. පියදාස උඩුල්දෙණිය මහතා
6. ජේ. ඩබ්ලිව්. පෙරේරා මහතා
7. එච්. එම්. පෙරේරා, මහතා.

10-271

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**බදුල්ල ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය බදුල්ල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛනය

1. සී. ජේ. සෙනරත් මහතා
2. ඒ. ඇම්. අබ්දුල්ලා සහිබ් මහතා
3. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) නැගෙනහිර කොට්ඨාශය
4. ඒ. ආර්. සී. වීරකෝන් මහතා

10-269

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**අංගොඩ මානසික ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය අංගොඩ මානසික ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛනය

1. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි), බටහිර කොට්ඨාශය
2. ගිල්මන් ද සිල්වා මහතා
3. ඇම්. ඇල්. පෙරේරා මහතා, ස. වි.
4. බී. ජී. විමලසිරි ද සිල්වා මහතා
5. කේ. ඒ. බී. කරුණාරත්න මහතා

10-270

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**පැලවත්ත මානසික ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය පැලවත්ත මානසික ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
සචිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛණය

1. එම්. සී. ඩබ්ලිව්. කුලරත්න මහතා
2. සී. පී. ගුණසිංහ මහතා
3. දිස්ත්‍රික් ඉංජිනේරු, කළුතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව.

10-268

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

**කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාව**

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ටී. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛනය

1. රෙජී රූපසිංහ මහතා
2. කේ. නාගලිංගම් මහතා ස. වි.
3. දොස්තර ආර්. රත්නම් මහතා ස. වි.
4. සී. පී. ගමගේ මහතා
5. ජිනදාස රණතුංග මහතා
6. එච්. ජී. ආරියවංශ මහතා
7. කේ. ජයසේන මහතා
8. ඕ. ඇම්. අන්ද්‍රයස් මහතා
9. ආනන්ද පෙරේරා මහතා
10. ප්‍රැන්සිස් නානායක්කාර මහතා
11. විජය ධර්මවර්ධන මහත
12. දොස්තර නාරද වර්ණසූරිය මහතා
13. ලොයිඩ් වෙත්තසිංහ මහතා.

10-266

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### දකුණු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වන දායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය දකුණු කොළඹ ආරෝග්‍යශාලා කරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

ඩී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාමලේඛනය

1. ආර්. ඒ. වී. පෙරේරා මහතා, ස. වි.
2. ඇම්. ඩී. ආර්. සේනාරත්න මහතා
3. එල්. එච්. සිරිසේන ද සිල්වා මහතා
4. පර්සි අබේගුණරත්න මහතා
5. දිස්ත්‍රික් ඉංජිනේරු, දකුණු කොළඹ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
6. සරත් කෝරාළගේ මහතා.

10-267

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### යාපනය ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වන කාලසීමාවට පහත සඳහන් අය යාපනය ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

ඩී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාමලේඛනය

1. එම්. ජී. බෂීර් මහතා
2. කේ. කයිලාසපිල්ලේ මහතා, ස. වි.
3. අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි), උතුරු කොට්ඨාශය
4. නාගරික කොමසාරිස්, පුරහල, යාපනය
5. කේ. සිවානන්දන් මහතා
6. එස්. රාසයියා මහතා
7. වී. යෝගීස්වරන් මහතා
8. ටී. කන්දයියා මහතා
9. එස්. කන්දසාමි මහතා
10. එස්. කණගලිංගම්චිට්ටු මහතා
11. එම්. සී. රවූප් මහතා
12. දෙස්තර එස්. ඒ. අම්බලවානා මහතා.

10-264

---

අංකය : ඩබ්. 105/133.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩ බලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ජාතික කම්කරු සංගමය, 94 1/6, යෝර්ක් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1.

හා

කොළඹ—තැ. පෙ. 211, ජේම්ස් fපින්ලේ ඇන්ඩ් කොම්පැනි, ලිමිටඩ් බාරේ, ඉංගිරියේ හල්වතුර වත්තේ (බී 69) අයිතිකරුවන් වන ඇන්ග්ලෝ ඇමරිකන් ඩිරෙක්ට් ටී ට්‍රේඩිං කොම්පැනි, ලිමිටඩ්, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කම්කරු විනිශ්චය සභා අංක 11 වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ දීය.

---

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ජාතික කම්කරු සංගමය,
94 1/6, යෝර්ක් ගොඩනැගිල්ල,
යෝර්ක් වීදිය, කොළඹ 1

සහ

කොළඹ—තැ. පෙ. 211, ජේම්ස් fපින්ලේ ඇන්ඩ් කොම්පැනි, ලිමිටඩ් බාරේ ඉංගිරියේ හල්වතුර වත්තේ (බී 69) අයිතිකරුවන් වන ඇන්ග්ලෝ-ඇමරිකන් ඩිරෙක්ට් ටී ට්‍රේඩිං කොම්පැනි ලිමිටඩ්. අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණ නම්, ඉංගිරියේ හල්වතුර වත්තේ පාලක පක්ෂය විසින් එස්. සාමිනාදන් මහතා තේ දළු නෙලන්නන් පරිපාලනය කිරීමේ සේවයෙන් පහකර, ඊට අනතුරුව අඩු කරන ලද වේතනයක් මත, පරිපාලන කංකානම් කෙනෙක් වශයෙන් සේවයේ යෙදවීම යුක්ති සහගතද, නොඑසේනම්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1970 සැප්තැම්බර් මස 21 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩ බලන කම්කරු කොමසාරිස්.

10-249/1

---

අංක ඩබ්. 105/133.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 දරණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1968 සැප්තැම්බර් මස 20 දින අංක 14,820 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කරන ලද 1968 සැප්තැම්බර් මස 10 වන දින දරණ නියෝගයෙන්, කොළඹ 1, යෝර්ක් වීදියේ අංක 94 1/6 දරණ යෝර්ක් ගොඩනැගිල්ලෙහි ජාතික කම්කරු සංගමය සහ (කොළඹ—තැ. පෙ. 211 ජේම්ස් fපින්ලේ ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ් බාරේ) ඉංගිරියෙහි හල්වතුර වත්තේ අයිතිකරුවන් වන, ඇන්ග්ලෝ ඇමරිකන් ඩිරෙක්ට් ටී ට්‍රේඩිං කොම්පැනි ලිමිටඩ් අතර ඇති 1968 සැප්තැම්බර් මස 4 දින දරණ ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 11 වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දුන් පෙනියන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1968 සැප්තැම්බර් මස 10 දින දරණ නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1070 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ දීය.

10-249/2

අංකය : ඩබ්ලිව්. 105/1351.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව

ලංකා කම්කරු සංගමය,
72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 7,

එක් පාර්ශවයක් වශයෙන්

හා

අනෙක් පාර්ශවය වශයෙන්,

කොළඹ, ලිලී වීදියේ අංක 25 හි (තැ. පෙ. 401) කොන්සොලිඩේටඩ් කොමර්ෂල් ඒජන්සීස් ලිමිටඩ් බාරේ, කොන්සොලිඩේටඩ් කොමර්ෂල් කොම්පැනි ලිමිටඩ් හා ඇක්ලන්ඩ් පිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හලාවත ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු ආර්. ආර්. එච්. රත්දෙනි මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ලංකා කම්කරු සංගමය,
72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 7,

එක්පාර්ශවයක් වශයෙන්

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

කොළඹ, ලිලී වීදියේ අංක 25 හි (තැ. පෙ. 401) කොන්සොලිඩේටඩ් කොමර්ෂල් ඒජන්සීස් ලිමිටඩ් බාරේ, ද කොන්සොලිඩේටඩ් කොමර්ෂල් කොම්පැනි ලිමිටඩ් හා ද ඇක්ලන්ඩ් fපිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස් මන්ට්ස් ලිමිටඩ් අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු නම් :

(1) ඇල්කඩුවේ හුන්නස්ගිරි වතුයායෙහි, කොන්සොලිඩේටඩ් කොමර්ෂල් කොම්පැණි ලිමිටඩ් කරන ලද සේවය සඳහා, 69.5.31 වන දිනට විශ්‍රාම ලැබීමේ වයසට නොපැමිණි ලංකා කම්කරු සංගමයේ අදාල් සාමාජිකයන්ට පාරිතෝෂික දීමනා සහ/හෝ වන්දි ගෙවීම සඳහා කර ඇති ඉල්ලීම යුක්ති සහගතද, එසේ නම්, කොපමණ ප්‍රමාණයක් පාරිතෝෂික දීමනා සහ/හෝ වන්දි ඔවුන් එකිනෙකට ගෙවිය යුතුද යන්නත්,

(2) යම් කම්කරුවෙක් 1969 මැයි 31 වන දිනට ඉතාමත් ලඟදී, යම්කිසි වල්නෙලීමේ කොන්ත්‍රාත්තුවක් බාරගෙන සිටියේ නම්, ඇක්ලන්ඩ් පිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් යටතේ එම කොන්ත්‍රාත්තුවට හිමිකම් ඇත්තේ ද, යන්නත් වේ.

1970 සැප්තැම්බර් මස 20 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩබලන කම්කරු කොමසාරිස්.

10-246

අංකය : සී/අයි. 14.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව

ලංකා වෙළඳ සේවක සංගමය, 22, 1/1, ඉහළ චැතැම් වීදිය කොළඹ 1

හා

මිලර්ස් ලිමිටඩ්, තැ. පෙ. 100, කොළඹ.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු එස්. බී. දොලපිහිල්ල මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 24 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ලංකා වෙළඳ සේවක සංගමය,
22 1/1, ඉහළ චැතැම් වීදිය,

සහ

මිලර්ස් ලිමිටඩ්,
තැ. පෙ. 100,
කොළඹ.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් :

(1) මිලර්ස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් අයිවන් සිරිවර්ධන මහතාගේ සතියක වේතන කැපීම සහ ඔහුට අවවාදකිරීම යුක්ති සහගතද යන්නත් ඔහුට කුමන සහනයන් හිමිද යන්නත්,

(2) මිලර්ස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් කේ. ධර්මදාස මහතාගේ වේතනය කැපීම, සේවයෙන් පහත හෙලීම සහ මාරුකිරීම යුක්ති සහගතද, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1970 සැප්තැම්බර් මස 16 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩබලන කම්කරු කොමසාරිස්.

10-255

අංකය : පී. 23/කො. 683/'70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩ බලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 7, රොස්මීඩ් පෙදෙසේ, අංක 8, ජෝර්ජ් එඩ්වර්ඩ් ක්‍රිස්ටි-ඩේවිඩ් මහතා, එක් පාර්ශ්වයක් වශයෙන් හා බ්‍රිටිෂ් සිලෝන් මිලින් කොම්පැණි ලිමිටඩ්, හල්ස්ඩෝර්ප් මිල්ස්, කොළඹ 12 හා බ්‍රිටිෂ් සිලෝන් කෝප රේෂන් ලිමිටඩ්, හල්ස්ඩෝර්ෆ් මිල්ස්, කොළඹ 12 අනෙක් පාර්ශ්වය වශයෙන් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ලේ අධිනීතිඥ ඩී. සමරවික්‍රම මහතාට මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 28 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරවුල් පනත

කොළඹ 7,
රොස්මීඩ් පෙදෙසේ අංක 8,
ජෝර්ජ් එඩ්වර්ඩ් ක්‍රිස්ටි-ඩේවිඩ් මහතා,
එක් පාර්ශ්වයක් වශයෙන්,

සහ

බ්‍රිටිෂ් සිලෝන් මිලින් කොම්පැණි ලිමිටඩ්, හල්ස්ඩෝප් මිල්ස්, කොළඹ 12 සහ බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්, හල්ස්ඩෝප් මිල්ස්, කොළඹ 12, අනෙක් පාර්ශ්වය වශයෙන්,

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කරුණු නම්,

(i) බ්‍රිටිෂ් සිලෝන් මිලින් කොම්පැණි ලිමිටඩ්හි කළමනාකාර තනතුරෙන් 1969 ඔක්තෝබර් මස 30 වන දින සිට බල පානසේ ජෝර්ජ් එඩ්වර්ඩ් ක්‍රිස්ටි-ඩේවිඩ් මහතා සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට කුමන සහන යන් හිමිද යන්නත්,

(ii) බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්හි සහකාර වැඩ කළමනාකරු වශයෙන්, ජෝර්ජ් එඩ්වර්ඩ් ක්‍රිස්ටි-ඩේවිඩ් මහතාට 1970 පෙබරවාරි මස 1 සිට මාසිකව රු. 2110 බැගින් වේතනය නොගෙවීම යුක්ති සහගතද යන්න හා ඔහුට කුමන සහනයන් හිමිද යන්නත් වේ.

1970 සැප්තැම්බර් මස 18 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩ බලන කම්කරු කොමසාරිස්.

10—301

---

අංකය : සී/අයි. 73ජ

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශවයක් වශයෙන් එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2 හා අනෙක් පාර්ශවය වශයෙන්, විටෝල් බවුස්ටඩ් ලිමිටඩ් සහ බොසන්කට් ඇන්ඩ් ස්ක්‍රයින් ලිමිටඩ්, 148, වොක්ෂෝල් වීදිය, කොළඹ 2, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආර[illegible] පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතර ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු ඒ. පී. බී. අබේසූරිය මහතාට මෙයින් යොමු කරනු ලැබේ.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 28 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

එක් පාර්ශවයක් වශයෙන් එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් විටෝල් බවුස්ටඩ් ලිමිටඩ් සහ බොසන්කට් ඇන්ඩ් ස්ක්‍රයින් ලිමිටඩ්, 148, වොක්ෂෝල් වීදිය, කොළඹ 2

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇත්තේ පහත දැක්වෙන කරුණු පිළිබඳව වේ :—

(1) නොමිලයේ තේ රාත්තල් දෙකක්ද, ශත 50 බැගින් තේ රාත්තල් දෙකක් ලාබෙටදීම.

(2) සමාගම් බිමෙන් පිටත වැඩ කටයුතුවල යෙදී සිටීම නිසා තේ ගැනීමට නොහැකිවන සේවකයන්ට තේ වෙනුවට දීමනාවක් ගෙවීම.

(3) ඉංජිනේරු අංශයේ යෙදී සිටින සියලුම සේවකයන්ට ප. ව. 12.30 ට වැඩඇරී යාමට ඉඩදීම.

(4) සේවකයෙක් හෝ ඔහුගේ පවුලේ අයෙකුගේ මරණයක් සිදු වූ විට, රු. 250 ක අවමංගල ආධාරයක් ගෙවීම.

(5) සමාගමේ සේවකයන් කරමින් සිටි වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් යෙදවීම අහෝසි කිරීම.

(6) සියලුම තාවකාලික කම්කරුවන් ස්ථිර සේවක කණ්ඩායමට අන්තර් ග්‍රහණය කිරීම.

(7) රජයේ ආරෝග්‍යශාලාවලින් ලබාගතයුතු වෛද්‍ය සහතික සඳහා සමාගමෙන් ගෙවීම.

(8) සේවා ස්ථානයට පැමිණෙනතුරු කාලය, සියලුම ඩ්‍රයිවර්වරු හා පෝටර්වරු සේවයේ යෙදීසිටිය ලෙස සැලකීම.

(9) බෝවෙන රෝගයන්ගෙන් පෙළෙන සියලුම සේවකයන්ට පඩි සහිත නිවාඩු දීම.

1970 සැප්තැම්බර් මස 23 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩබලන කම්කරු කොමසාරිස්.

10-300

---

අංකය : ඊ 23/කො. 54/69.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව මාතලේ, මීවත්තේ කුඹුර පාරේ, අංක 27 හි, ඩබ්ලිව්. ගුණසේකර මෙනෙවිය හා කොළඹ 8, බොරැල්ලේ චන්ද්‍රලේඛා මාවතේ අංක 12 හි ආර්. බී. ජයසිංහ මහතා එක් පාර්ශවයක් වශයෙන්, හා

කොළඹ 12, සෝන්ඩර්ස් පෙදෙසේ අංක 11 හි සීමාසහිත කොළඹ සමුපකාර කඩ සමිති සංගමය (ඇවරකරු භාරයේ) සහ කොළඹ 12, සෝන්ඩර්ස් පෙදෙසේ අංක 19 හි, සීමාසහිත කොළඹ පාරිභෝගිකයන්ගේ සමුපකාර සමිතිය, අනෙක් පාර්ශවය වශයෙන්, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XV වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 25 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

මාතලේ, මීවත්තේකුඹුර පාරේ අංක 27 හි, ඩබ්ලිව්. ගුණසේකර මෙනෙවිය හා කොළඹ 8, බොරැල්ලේ චන්ද්‍රලේඛා මාවතේ අංක 12 හි, ආර්. බී. ජයසිංහ මහතා එක් පාර්ශවයක් වශයෙන් ද,

සහ

කොළඹ 12, සෝන්ඩර්ස් පෙදෙසේ, අංක 11 හි සීමාසහිත කොළඹ සමුපකාර කඩ සමිති සංගමය (ඇවරකරු භාරයේ) සහ කොළඹ 12, සෝන්ඩර්ස් පෙදෙසේ, අංක 19 හි, සීමාසහිත කොළඹ පාරිභෝගිකයන්ගේ සමුපකාර සමිතිය අනෙක් පාර්ශ්වය වශයෙන් පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කරුණු නම් :

(1) ඩබ්ලිව්. ගුණසේකර මෙනවිය සහ ආර්. බී. ජයසිංහ මහතා සීමාසහිත කොළඹ පාරිභෝගිකයන්ගේ සමුපකාර සමිතිය යටතේ රැකියාවට හිමිකම්කීම යුක්තිසහගතද, එසේ නම්,

(අ) ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද ?

(ආ) නොඑසේ නම්, (දැනට ඇවරකරුවෙකු වෙත යොමුකර ඇති) සීමාසහිත කොළඹ සමුපකාර කඩසමිති සංගමයෙන් ඔවුන් එකිනෙකාට,

(i) 1967.3.1 වන දින සිට රැකියාව අහිමිවීම පිළිබඳවත්,

(ii) පසුගිය සේවා කාලය සඳහා පාරිතෝෂික දීමනා වශයෙනුත්,

කුමන සහනයන් හිමිද ?

(2) ඩබ්ලිව්. ගුණසේකර මෙනවිය හා ආර්. බී. ජයසිංහ මහතා (දැනට ඇවරකරුවෙකු වෙත යොමුකර ඇති) සීමාසහිත කොළඹ සමුපකාර කඩසමිති සංගමය විසින් සේවය අත්හිටුවා තිබූ කාලය සඳහා ඔවුන්ට වේතන නොගෙවීම යුක්තිසහගතද ? නොඑසේ නම්, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් වේ.

1970 අගෝස්තු මස 30 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදි.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්.

10—250

---

## පඩිපාලක සභා ආඥපනත
**නිවේදනයයි**

136 වැනි අධිකාරය වන පඩිපාලක සභා ආඥපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමැතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිටි වීර විමලරත්න මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියමකොට පත්කරනු ලැබූ සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට ඩබ්ලිව්. එම්. තන්දිසේන මහතා ;
2. තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින්ව සිටි ජී. බී. පෙරේරා සහ ඒ. ව්. ඇම්. ලූයිස් යන මහතුන් වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියමකොට පත්කරනු ලැබූ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට කේ. ඇම්. ඇම්. බී. කරුණාරත්න සහ ඩී. ඩී. සූරියආරච්චි යන මහතුන්.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 6 වැනි දින,
කොළඹ දී ය.
10-479

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනත

1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ 33 වන වගන්තිය යටතේ පුත්තලමේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය මවිසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.8.11.

**සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය**

1. වැඩයේ නම සහ විස්තරය : අන්දහන් කට්ටුව වැව අයි/6 (12.00 × 6.35).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ සවභාවය :—

පෞද්ගලික ඉඩම් : දල වශයෙන් අක්කර 37 යි.
රජයේ ඉඩම් : දල වශයෙන් අක්කර — යි.

3. එකඟවූ කොන්දේසි නම්—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් :—

(i) වැටි බැම්ම සෑදීම.
(ii) කඩුලු තුනකින් යුත් පාලකයක් ඉදිකිරීම.
(iii) සොරොව් දෙකක් ඉදිකිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 30,000 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සළකා එම වැඩය අවසන් කලායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

10-262

---

## 1971 වසර වෙනුවෙන් බදුල්ල දිසාවේ ගිනි අවි බලපත් අළුත් කිරීම

1971 වසර වෙනුවෙන් ගිනි අවි බලපත් අළුත් කිරීම බදුල්ල දිසාව තුළ පිහිටි අදාළ කොට්ඨාශ භාර ප්‍රාදේශීය ආදායම් නිළධාරීන් විසින් 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට අරඹන බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1971 වසර වෙනුවෙන් බලපත් අළුත් කිරීම, 1970 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඉන් පළමුව කළ යුතු බවත් එසේ කිරීම සඳහා ප්‍රාදේශීය ආදායම් නිළධාරීන් වෙත 1970 වසර බලපත් භාර දිය යුතු අතර පිරික්සුම පිණිස අවි ඉදිරිපත් කළ යුතු බවත් අවි හිමියන් වෙත නිවේදනය කරමි.

3. 1970 දෙසැම්බර් 31 වැනි දිනට පසුව ලැබෙන ඉල්ලුම් වෙනුවෙන් බලපත් ගාස්තුවත් එයට අමතරව දඩයකුත් ගෙවීමට සිදුවන බැව් සලකන්න. පාවිච්චියට නුසුදුසු හා පාවිච්චි කිරීමට බලාපොරොත්තු නොවන අවි හා බලපත් ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිළධාරීන් වෙත 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට පළමු භාර දිය යුතු බැව් දන්වමි.

4. 1971 වසර වෙනුවෙන් බලපත් අළුත් නොකර සිටින්නන්ට විරුද්ධව නඩු පැවරීම 1971 මාර්තු මස 31 වැනි දින සිට අරඹන බැව් නිවේදනය කරමි.

ඩබ්ලිව්. තිලකරත්න,
බදුලු දිසාවේ අතිරේක දිසාපති හා
බලපත් නිකුත් කිරීමේ බලධාරී.

1970 සැප්තැම්බර් මස 12 වෙනි දින,
බදුලු දිසාපති කාර්යාලයේ දීය.

10-242

---

## 1971 වර්ෂයට තුවක්කු බලපත්‍ර (ලැයිසන් පත්‍ර) අළුත් කිරීම

1971 වර්ෂයට තුවක්කු බලපත්‍ර (ලැයිසන් පත්‍ර) අළුත් කිරීම 1970 නොවැම්බර් මස 1 වැනිදායින් ආරම්භ වන බවත් බලපත්‍ර අළුත් කරවා ගැනීම 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට ප්‍රථමයෙන් කර ගත යුතු බවත් සියළුම තුවක්කු හිමියන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. බලපත්‍ර අළුත් කර ගැනීම පිණිස බලපත්‍ර ගාස්තු සමග 1970 බලපත්‍රය ද, තුවක්කුව ද ඉදිරිපත් කළ යුතු වේ. බලපත්‍ර නැතිවී ඇති අවස්ථාවන්හි දී රු. 1 ක මුද්දලක් ගෙවා නැතිවීමේ සහතිකයක් කලින් ලබාගෙන එය ඉදිරිපත් කළ යුතු බව ද සැලකිය යුතුයි.

1970 දෙසැම්බර් මස 31 වැනිදායින් පසු, 1971 ට වලංගු (අළුත් කළ) බලපත්‍රයක් නොමැතිව තුවක්කුවක් ළඟ තබා ගැනීම නීති විරෝධී ක්‍රියාවක් වන්නේ ය. 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | හවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3 30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී